# 10. බුද්ධානසාසනං

## දසමො පාඨො



**න හි වෙරෙන වෙරානි**

**සම්මන්තී'ධ කුදාචනං**

**අවෙරෙන ච සම්මන්ති**

එස ධම්මො සනන්තනො

පරෙ ච න විජානන්ති

මයමෙත්ථ යමාමසෙ

යෙ ච තත්ථ විජානන්ති

තතො සම්මන්ති මෙධගා

සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු අසංවුතං

භොජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීනවීරියං

තං වෙ පසහති මාරො - වාතො රුක්ඛං'ව දුබ්බලං

**අසුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු සුසංවුතං**

**භොජනම්හි ච මත්තඤ්ඤුං - සද්ධං ආරද්ධවීරියං**

**තං වෙ නප්පසහති මාරො - වාතො සෙලං'ව පබ්බතං**

**(ධම්මපදය යමක වග්ගය)**

## වචන මාලාව

1. හි - ඒකාන්තයෙන්
2. වෙර - වෛරය
3. සම්මන්ති - සංසිඳෙත්
4. ඉධ - මෙහි, මේ ලෝකයේ
5. කුදාචනං - කිසිදා
6. සනන්තනො - සනාතන, සදාකාලික
7. විජානාති - දනියි
8. එත්ථ - මෙහි
9. යමාමසෙ - (මරුමුවට) යම්හ යැයි
10. තතො - එයින්
11. මෙධගා - කලහ
12. තත්ථ - එහි
13. අසංවුත - නොහික්මුණු
14. අමත්තඤ්ඤු - පමණ නොදන්නා
15. කුසීත - කම්මැලි
16. පසහති - පෙළයි
17. කෙත - කුමකින්

## කරණ විභක්තිය

- <u>වෙරෙන</u> වෙරානි න සම්මන්ති.
  (වෛරයෝ <u>වෛරයෙන්</u> නො සංසිඳෙති)

- <u>අවෙරෙන</u> වෙරානි සම්මන්ති.
  (<u>අවෛරයෙන්</u> වෛරයෝ සංසිඳෙති)

මෙම වගන්ති දෙකේ ඉරි ඇඳි පද තබා ඇත්තේ කරණ විභක්තියෙනි. වෛරය සංසිඳීමට හේතු වූ කාරණය යන අදහසිනි. ''**හේතුකොට ගෙන, කරණ කොට ගෙන, උපකාරයෙන්**'' යන අදහස කරණ විභක්තියෙන් ලැබේ.

**කරණ විභක්ති පද යොදා ඇති පහත වගන්ති බලන්න.**

- අහං පුප්ඵෙන බුද්ධං පූජෙමි - මම මලෙන් බුදුන් පුදමි.
- සො අග්ගිනා ඣාපෙති - හෙතෙම ගින්නෙන් දවයි.
- මයං පාදෙහි ගච්ඡාම - අපි පා වලින් යමු.
- සිස්සො හත්ථෙන ලිඛති - ශිෂ්‍යයා අතින් ලියයි.
- රාජා රථෙන ගච්ඡති - රජතුමා රථයෙන් යයි.

**කරණ විභක්තියේ නාම වරනැගෙන අයුරු බලන්න.**

| කරණ විභක්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි |
| අග්ගි | අග්ගිනා | අග්ගීහි, අග්ගීභි |
| දණ්ඩී | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| භික්ඛු | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |

| | | |
|---|---|---|
| කඤ්ඤා | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| නදී | නදියා, නජ්ජා | නදීහි, නදීභි |
| චිත්ත | චිත්තේන | චිත්තේහි, චිත්තේභි |
| සබ්බ | සබ්බේන | සබ්බේහි, සබ්බේභි |
| ඉම | අනේන, ඉමිනා | එහි, එභි, ඉමේහි, ඉමේභි |

## අභ්‍යාසය 10 1

1. සිංහලයට නගන්න.
    1. ආනන්දෝ හත්ථේන සකුණං ආහරති.
    2. එසෝ රථේන ගාමං ගච්ඡති.
    3. ත්වං පාදේන මා පහරි.
    4. තුම්හෙ කේන ආගච්ඡථ?
    5. අහං ඉමිනා පුත්ථකමෙමන මොක්ඛං ලභාමි.

2. පාලියට නගන්න.
    1. ඇතා පා වලින් දුවයි.
    2. ළමයා දණ්ඩෙන් ගසයි.
    3. හෙතෙම කුමකින් ගසයි ද?
    4. ගුරුතුමා අතින් ගනියි.
    5. වඳුරා අත් වලින් ද පා වලින් ද පනියි.

3. කරණ විභක්ත්‍යන්ත පද යොදා වාක්‍ය පහක් සාදන්න.

4. පාඩමේ එන ගාථා සිංහලට නගන්න.

5. කරණ විභක්ති පද යොදා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. පුරිසො ........................ (පාද) ගච්ඡති.
2. කස්සකො ......................... (ඵරසු) රුක්ඛං ඡින්දති.
3. බාලකො .......................... (හත්‍ථ) සුනඛං පහරති.
4. අහං .......................... (කුසුම) බුද්ධං පූජෙමි.
5. සො .......................... (චක්ඛු) රූපං පස්සති.

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න**

| ස්ත්‍රී ලිංග ආකාරාන්ත "කඤ්ඤා" ශබ්දය (කන්‍යාව, දස හැවිරිදි ස්ත්‍රීන්) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | කඤ්ඤා | කඤ්ඤා, කඤ්ඤායො |
| ආලපන | (හෙ) කඤ්ඤෙ | (භොති) කඤ්ඤා, කඤ්ඤායො |
| දුතියා | කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො |
| තතියා | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| කරණ | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| චතුත්‍ථී | කඤ්ඤාය | කඤ්ඤානං |
| පඤ්චමී | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| ඡට්ඨී | කඤ්ඤාය | කඤ්ඤානං |
| සත්තමී | කඤ්ඤාය, කඤ්ඤායං | කඤ්ඤාසු |